# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 88/35 — 1973 දෙසැම්බර් 01 වැනි සෙනසුරාද — 1973.12.01

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1973 අංක 12 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග**

**68 (1) වෙනි නියෝගය යටතේ වූ ආඥව**

මෙහි උපලේඛනයෙහි විස්තර කෙරෙන සංවිධානය සම්බන්ධයෙන් ඒ සංවිධානය විසින් හෝ එහි සාමාජිකයන් හෝ පාක්ෂිකයන් විසින් මහජන ආරක්ෂාවට, මහජන සාමය පවත්වා ගැනීමට හෝ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගැනීමට හානි කරවූ කාර්යයන් සඳහා නොහොත් 1973 අංක 12 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 24 වෙනි නියෝගයේ (අ) සිට (උ) දක්වා වූ ඡෙදවල හෝ 38 වෙනි නියෝගයේ (2) වෙනි ඡෙදයේ (අ) සහ (ආ) යන අනුඡෙදයන්හි සඳහන් කාර්‍ය කිසිවක් සඳහා ක්‍රියා කිරීමේ නොහොත් ඒ සංවිධානය හෝ එහි සාමාජිකයන් හෝ පාක්ෂිකයන් ප්‍රයෝජනයට ගැනීමේ අන්තරාය ඇතැයි සෑහීමකට පත්වූයෙන්, අග්‍රාමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම, ඒ සංවිධානය තහනම් කරනු ලැබූ සංවිධානයක් ලෙස ඒ නියෝගවල 68 වෙනි නියෝගයේ (1) වෙනි ඡෙදයෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර මේ ආඥවෙන් ප්‍රකාශ කරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය.

1973 දෙසැම්බර් මස 1 වැනි දින,
කොළඹ.

**උපලේඛනය**

**සාමාන්‍යයෙන් ජනතා විමුක්ති පෙරමුණ යනුමෙන් හැඳින්වෙන සංවිධානය.**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

89 A——ඒ 04719—2,000 (73/11)